# අ.පො.ස (උ.පෙළ) – 2023/2025 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

පහත පරිදි විෂය ධාරාවන් 6ක් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම සිදුවේ.

| විෂය ධාරාව | ඇතුළත් කර ගැනීමට නියමිත සිසුන් සංඛ්‍යාව |
|---|---|
| භෞතීය විද්‍යා | 160 |
| ජෛව විද්‍යා | 80 |
| වාණිජ | 80 |
| ඉංජිනේරු තාක්ෂණවේදය | 80 |
| කලා | 40 |
| සංයුක්ත ගණිතය,භෞතික විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 40 |
| | **480** |

## ඇතුළත්වීමේ මූලික සුදුසුකම් (අ.පො.ස (සා.පෙළ) – 2022(2023) විභාගයට පාසල් අයදුම්කරුවකු ලෙස රිච්මන්ඩ් විද්‍යාලයෙන් පළමු වරට පෙනී සිටි සිසුන් සඳහා)

පහත අංක **1, 2,** සහ **3** යටතේ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාර ව අ.පො.ස (උ.පෙළ) හැදෑරීම සඳහා තිබිය යුතු **අවම සුදුසුකම්** දක්වා ඇත. මීට අමතර ව එක් එක් විෂය ධාරාව යටතේ එම විෂය ධාරාව හැදෑරීමට විශේෂයෙන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා දක්වා ඇත.

<u>කෙසේවුව ද යම් විෂය ධාරාවක් සඳහා උක්ත වගුව ප්‍රකාරව බඳවා ගැනීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉල්ලුම් කරනු ලැබුවහොත් පමණක් එකී විෂයය ධාරාව හැදෑරීමට අවශ්‍ය අවම සුදුසුකම් ම විසින් අවස්ථානුකූලව තීරණය කෙරෙන බව ද එය ඒ සම්බන්ධයෙන් වන අවසාන තීරණය වන බව ද අවධාරණය කරමි.</u>

පාසල තුළ අධ්‍යයන කටයුතු සිදු කෙරෙන කුමන හෝ විෂයය ධාරාවකට බාහිර සිසුන් ඇතුළත් කර ගනු ලබනුයේ අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගය සඳහා පළමු වරට හෝ දෙවනවරට පාසල් අයදුම්කරුවකු ලෙස පෙනී සිට අවශ්‍ය අවම හා විශේෂිත සුදුසුකම් සම්පූර්ණ කර අ.පො.ස (උ.පෙළ) සඳහා අයදුම්කරන ලද විද්‍යාලයීය සිසුන් සියළු දෙනා ඇතුළත් කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු සඳහා පමණි.

1. අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දි මාධ්‍ය භාෂාව හා ගණිතය ඇතුළත් ව ඕනෑම විෂයයන් 6කින් සමත්ව ඉන් අවම වශයෙන් විෂයයන් 3කට සම්මාන සාමාර්ථ (C) හෝ ඊට ඉහළ සාමාර්ථ (B හෝ A) ලබා තිබීම

   හෝ

2. අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දි ඕනෑම විෂයයන් 6කින් සමත්ව ඉන් අවම වශයෙන් විෂයයන් 3කට සම්මාන සාමාර්ථ (C) හෝ ඊට ඉහළ සාමාර්ථ (B හෝ A) ලබා ඇති එහෙත් ගණිතය විෂයය අසමත්

   (* අ.පො.ස (සා.පෙළ) – 2023 හෝ අ.පො.ස (සා.පෙළ) – 2024 විභාග සඳහා පෙනී සිට ගණිත විෂයය සමත්වීමේ පදනම මත සුදුසුකම් ලබයි)

   හෝ

3. අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී මාධ්‍ය භාෂාව හෝ ගණිතය ඇතුළත් ව හර විෂයයන් 5කින් සමත්ව ඉන් අවම වශයෙන් විෂයයන් 3කට සම්මාන සාමාර්ථ (C) හෝ ඊට ඉහළ සාමාර්ථ (B හෝ A) ලබා තිබීම

   * මාධ්‍ය භාෂාව අසමත් සිසුන් අ.පො.ස (සා.පෙළ) – 2023 විභාගයේදී ම මාධ්‍ය භාෂාව සමත්වීම අනිවාර්යය වන අතර එලෙස සමත් ව පෙන්වීමේ කොන්දේසිය මත **තාවකාලික පදනමින්** උසස් පෙළ කලා විෂය ධාරාවට ඇතුළත් කිරීම සිදුවේ. **එලෙස සුදුසුකම් සම්පූර්ණ කර නොගතහොත් පාසලෙන් ඉවත් කෙරේ.** කෙසේවුව ද ප්‍රතිඵල නැවත සමීක්ෂණයට ඉල්ලා ඇති සිසුන් සඳහා ප්‍රතිඵල එනතුරු පමණක් පාසලේ රැඳී සිටීමට අවකාශ සැලසේ.

**සටහන:** අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී ඉහත 1, 2, 3, යටතේ අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කළ ද සම්මාන 2ක් පමණක් ලබා ඇති සිසුන් සාමාන්‍ය සාමාර්ථයක් ලබා ඇති විෂයයකට (මාධ්‍ය භාෂාව හෝ ගණිතය හැර) පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ සම්මාන හෝ ඊට ඉහළ නිපුණතාවක් ලබා ඇත්නම් එම විෂයයට අ.පා.ස (සා.පෙළ) **කලා විෂය ධාරාවට ඇතුළත්වීමට පමණක්** සම්මාන සාමාර්ථයක් ලබා ඇති බවට සැලකේ. එනම් ප්‍රතිඵල සටහනෙහි විෂයයට අදාළ ව ලබාගත් ශ්‍රේණියට ඉදිරියෙන් 1 හෝ 2 හෝ 3 හෝ ලෙස නිපුණතා මට්ට ම සටහන්ව තිබිය යුතුයි.

## අ.පො.ස (උ.පෙළ) හැදෑරීම සඳහා විෂය ධාරා/විෂයයන්/විෂයය සංයෝජන තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු විශේෂ කරුණු

- තෝරා ගන්නා විෂයය ධාරාව තම අනාගත සුභ සිද්ධිය කෙරෙහි කෙතරම් දුරට ඉවහල් වන්නේ ද යන බව සහ තම අනාගත ඉලක්කයන් ඒ හරහා පූරණය කරගත හැකි ද? යන්න
- තෝරා ගන්නා විෂයය ධාරාවක් වෙනස් කිරීමට අවස්ථාව ලැබෙනුයේ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇතිවිට හා පුරප්පාඩු ඇතිවිට උසස් පෙළ පන්තියට ඇතුළත් වර්ෂයේ දී පමණක් ම වන බව
- තෝරා ගන්නා ලද විෂයය සංයෝජනය අදාළ කර ගත හැකි විශ්ව විද්‍යාල ප්‍රවේශය පාඨමාලාවන් තම අනාගත ඉලක්කයන් හා කෙතරම් දුරට ගැලපේ ද යන්න
- තෝරා ගන්නා විෂයයන් මෙහි මතු සඳහන් කොන්දේසිවලට අනුකූලව පමණක් ම තෝරා ගත හැකි වන බව
- තෝරා ගන්නා විෂයයන්ගෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් සක්‍යතාවයක් තමා තුළ ඇති ද යන්න
- තෝරා ගන්නා ලද විෂයයන් සඳහා රැකියා වෙළඳපොළෙහි ඇති ඉල්ලුම කෙබඳු ද යන්න
- අ.පො.ස (උ.පෙළ) සමත් ලෙස සලකනුයේ ප්‍රධාන විෂයයන් තුනම සමත් වුවහොත් පමණක් බව සහ එක් විෂයයකින් හෝ අසමත් වුවහොත් ලබා ඇති ඉහළ ම අධ්‍යාපන සුදුසුකම "අ.පො.ස (සා.පෙළ) සමත්" යන සුදුසුකම වන බව

***විෂයය සංයෝජන තෝරා ගැනීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක: 2016/13 (https://moe.gov.lk/wp-content/uploads/2020/07/2016-13s.pdf යන link එක හරහා බාගත හැක) හා වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් ඒ ඒ අධ්‍යයන වර්ෂයසඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත් කරන ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය නම් අත්පොත ද පරිශීලනය කිරීම කළ යුතු වේ.***

**කලා විෂයය ධාරාවෙන් අ.පො.ස (උ.පෙළ) – 2025 සඳහා පළමුවරට පෙනී සිටීමට අපේක්ෂිත සිසුන් සඳහා තෝරා ගැනීමට අවකාශ සැලසෙන විෂයයන්/විෂයය සංයෝජන**

**විශේෂයෙන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා**

- අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී ලබාගත් සම්මාන තුන අතරින් එකක්වත් තෝරා ගන්නා විෂයයකට අදාළ විය යුතුයි.

- අ.පො.ස (උ.පෙළ) විෂයයක් ලෙස චිත්‍ර හෝ නැටුම් හෝ සංගීතය හෝ නාට්‍ය හා රංග කලාව යන විෂයයන්ගෙන් එකක් තෝරා ගැනීමට අපේක්ෂා කරයි නම් අදාළ විෂයය ට අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුයි.

- සෞන්දර්යය විෂයයන් දෙකක් හදාරන්නේ නම් අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී එම විෂයයන් දෙකෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුයි.

- (අ.පො.ස (උ.පෙළ) විෂයයක් ලෙස නැටුම් හෝ සංගීතය හෝ නාට්‍ය හා රංග කලාව යන විෂයයන් තොරා ගැනීමට අපේක්ෂිත සිසුවකුට අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී එකී විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා නොතිබුණ ද එම විෂයය ට පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ සම්මාන හෝ ඊට ඉහළ නිපුණතාවක් ලබා ඇත්නම් එය ප්‍රමාණවත් වනු ඇත)

කලා විෂයය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් සමාජයීය විද්‍යා/ව්‍යවහාරික සමාජ අධ්‍යයන, ආගම් හා ශිෂ්ටාචාරල, සෞන්දර්යය අධ්‍යයන සහ භාෂා යන විෂයය කාණ්ඩ යටතේ සඳහන් කොන්දේසි අනුව විෂයයන් තුනක් තෝරා ගත යුතු වේ.

## <u>සමාජයීය විද්‍යා/ව්‍යවහාරික සමාජ අධ්‍යයන විෂයයන්</u>

පාසලේ පවතින භෞතික හා මානව සම්පත් අනුව මෙම කාණ්ඩය යටතේ ඔබට තෝරා ගත හැකි විෂයයන් සහ ඒවා තෝරා ගැනීම සඳහා වන කොන්දේසි පහත දක්වා ඇත.

තෝරා ගන්නා විෂයයන් තුනෙන් **<u>අවම වශයෙන් එක් විෂයයක් හෝ</u>** පහත දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව **තෝරාගත යුතු ය**. ඔබගේ මනාපය අනුව දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව මෙම කාණ්ඩයෙන් **<u>විෂයයන් දෙකක් හෝ තුනම හෝ තෝරා ගත හැක.</u>**

* ආර්ථික විද්‍යාව හෝ ගෘහ ආර්ථික විද්‍යාව

* භූගෝල විද්‍යාව හෝ තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය හෝ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

* දේශපාලන විද්‍යාව හෝ තොරතුරු හා සන්නවේදන තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව

## <u>ආගම් හා ශිෂ්ටාචාර විෂයයන්</u>

***(තර්ක ශාස්ත්‍රය හෝ භූගෝල විද්‍යාව හෝ ඉංග්‍රීසි හෝ සන්නිවේදන හා මාධ්‍යය අධ්‍යයනය යන විෂයයන්ගෙන් එකක් හෝ තෝරා ගැනුනු සිසුන් හැර අනෙක් සිසුන් සඳහා පමණක් අදාළ වේ)***

පාසලේ පවතින භෞතික හා මානව සම්පත් අනුව මෙම කාණ්ඩයෙන් ඔබගේ මනාපය අනුව **<u>එක් විෂයයක් පමණක් තෝරාගත හැක</u>**.

* බෞද්ධ ශිෂ්ටාචාරය

* ක්‍රිස්තියානි ධර්මය (ගුරුවරයකු යොදවා ගැනීමට හැකියාව පවතී නම් පමණි)

## <u>සෞන්දර්ය අධ්‍යයන විෂයයන්</u>

පාසලේ පවතින භෞතික හා මානව සම්පත් අනුව පහත කොන්දේසිවලට අනුකූලව මෙම කාණ්ඩයෙන් ඔබගේ මනාපය අනුව **<u>උපරිම විෂයයක් දෙකක් පමණක් තෝරාගත හැක</u>**.

- *භාෂා විෂයයන් (ඉංග්‍රීසි, චීන හැර) හෝ ආර්ථික විද්‍යාව හෝ ගෘහ ආර්ථික විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් හෝ* ***<u>තෝරා ගත් සිසුවකු නොවේ නම්,</u>***

* චිත්‍ර කලාව

* නර්තනය (දේශීය)

* සංගීතය (පෙරදිග)

* සංගීතය (අපරදිග) - (ගුරුවරයකු යොදවා ගැනීමට හැකියාව පවතී නම් පමණි)

* නාට්‍ය හා රංග කලාව (සිංහල)

## <u>භාෂා විෂයයන්</u>

පාසලේ පවතින භෞතික හා මානව සම්පත් අනුව මෙම කාණ්ඩයෙන් පහත කොන්දේසිවලට අනුකූලව ඔබගේ මනාපය අනුව **<u>එක් විෂයයක් හෝ විෂයයන් දෙකක් තෝරාගත හැක.</u>**

- *ආර්ථික විද්‍යාව හෝ ගෘහ ආර්ථික විද්‍යාව හෝ සෞන්දර්යය අධ්‍යයන විෂයය කාණ්ඩයට අයත් විෂයයන්ගෙන් එකක්වත්* ***<u>තෝරා ගත් සිසුවෙකු නොවේ නම්,</u>***

  * සිංහල හෝ ප්‍රංශ හෝ ජපන් - (ගුරුවරයකු යොදවා ගැනීමට හැකියාව පවතී නම් පමණි)

- *තර්ක ශාස්ත්‍රය හෝ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය හෝ භූගෝල විද්‍යාව හෝ ආගමික හා ශිෂ්ටාචාර යන විෂයය කාණ්ඩයට අයත් විෂයයන්ගෙන් එකක්වත්* ***<u>තෝරා ගත් සිසුවෙකු නොවේ නම්,</u>***

  * ඉංග්‍රීසි

- *දේශපාලන විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන්ගෙන් එකක්වත්* ***<u>තෝරා ගත් සිසුවෙකු නොවේ නම්,</u>***

  * චීන

**වාණිජ විෂයය ධාරාවෙන් අ.පො.ස (උ.පෙළ) – 2025 සඳහා පළමුවරට පෙනී සිටීමට අපේක්ෂිත සිසුන් සඳහා තෝරා ගැනීමට අවකාශ සැලසෙන විෂයයන්/විෂයය සංයෝජන**

**විශේෂයෙන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා**

- අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී ලබාගත් සම්මාන තුනෙන් එකක් ව්‍යවසායකත්ව අධ්‍යයනයට හෝ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය හෝ ගණිතය විෂයයට ලබා තිබිය යුතු ය.

- අ.පො.ස (උ.පෙළ) විෂයයක් ලෙස සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන කවර හෝ විෂයයක් හදාරන්නේ නම් අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී සිංහල භාෂාව හා සාහිත්‍යය/ඉංග්‍රීසි යන විෂයයන්ගෙන් අදාළ වන විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

- අ.පො.ස (උ.පෙළ) විෂයයක් ලෙස ආගමක් හෝ ආගමික ශිෂ්ටාචාරයක් විෂයයක් ලෙස හදාරන්නේ නම් අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී එම අදාළ විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

වාණිජ විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන තෝරා සිසුන් පහත විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතු ය.

* ගිණුම්කරණය

* ව්‍යාපාර අධ්‍යයනය

* ආර්ථික විද්‍යාව

* ව්‍යාපාර සංඛ්‍යානය - (ගුරුවරයකු යොදවා ගැනීමට හැකියාව පවතී නම් පමණි)

පාසලේ පවතින භෞතික හා මානව සම්පත් අනුව විෂයයන් දෙකක් පමණක් තෝරා ගන්නා ලද සිසුන් සෙසු විෂයය පහත දැක්වෙන පරිදි තෝරාගත යුතු ය.

* ***ගිණුම්කරණය විෂයය තෝරා නොගන්නේ නම්*** භූගෝල විද්‍යාව හෝ තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය හෝ ඉංග්‍රීසි හෝ බෞද්ධ ශිෂ්ටාචාරය හෝ ක්‍රිස්තියානි ධර්මය - (ගුරුවරයකු යොදවා ගැනීමට හැකියාව පවතී නම් පමණි)

* ***ව්‍යාපාර අධ්‍යයනය විෂයය තෝරා නොගන්නේ නම්*** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හෝ දේශපාලන විද්‍යාව

* ***ආර්ථික විද්‍යාව විෂයය තෝරා නොගන්නේ නම්*** ප්‍රංශ භාෂාව හෝ ව්‍යාපාර සංඛ්‍යානය

**ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය ධාරාවෙන් අ.පො.ස (උ.පෙළ) – 2025 සඳහා පළමුවරට පෙනී සිටීමට අපේක්ෂිත සිසුන් සඳහා තෝරා ගැනීමට අවකාශ සැලසෙන විෂයයන්/විෂයය සංයෝජන**

**විශේෂයෙන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා**

- අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සමත් ව තිබිය යුතු ය.

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂයයන් අනිවාර්යයයෙන් ම තෝරාගත යුතු වේ.

* ඉංජිනේරු තාක්ෂණවේදය

* තාක්ෂණවේදය සඳහා විද්‍යාව

සෙසු විෂයය පහත සඳහන් විෂයයන් අතුරින් තෝරාගත යුතු ය.

* තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හෝ ව්‍යාපාර අධ්‍යයනය

**ජෛව විද්‍යා විෂයය ධාරාවෙන් අ.පො.ස (උ.පෙළ) – 2025 සඳහා පළමුවරට පෙනී සිටීමට අපේක්ෂිත සිසුන් සඳහා තෝරා ගැනීමට අවකාශ සැලසෙන විෂයයන්/විෂයය සංයෝජන**

**විශේෂයෙන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා**

- අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී ලබාගත් සම්මාන තුනෙන් එකක් විද්‍යාව විෂයයට ලබා තිබිය යුතු වන අතර ගණිතය විෂයය සමත් ව තිබිය යුතු ය.

මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් **ජීව විද්‍යාව** සහ **රසායන විද්‍යාව** යන විෂයයන් සමග පහත සඳහන් විෂයයන් අතුරින් විෂයයක් තෝරා ගත යුතු ය.

* භෞතික විද්‍යාව

* කෘෂි විද්‍යාව

**භෞතීය විද්‍යා විෂයය ධාරාවෙන් අ.පො.ස (උ.පෙළ) – 2025 සඳහා පළමුවරට පෙනී සිටීමට අපේක්ෂිත සිසුන් සඳහා තෝරා ගැනීමට අවකාශ සැලසෙන විෂයයන්/විෂයය සංයෝජන**

**විශේෂයෙන් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා**

- අ.පො.ස (සා.පෙළ) – 2022 (2023) විභාගයේ දී ලබාගත් සම්මාන තුනෙන් එකක් ගණිතය විෂයයට ලබා තිබිය යුතු වන අතර විද්‍යාව විෂයය සමත් ව තිබිය යුතු ය.

පාසලේ පවතින භෞතික හා මානව සම්පත් අනුව මෙම විෂය ධාරාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් ට අනිවාර්යයෙන් ම පහත සඳහන් විෂයයන් තුන තෝරා ගැනීමට සිදු වේ.

* සංයුක්ත ගණිතය

* රසායන විද්‍යාව

* භෞතික විද්‍යාව

**අ.පො.ස (උ.පෙළ) – 2025 සඳහා පළමුවරට පෙනී සිටීමට අපේක්ෂිත සිසුන් සඳහා තෝරා ගැනීමට අවකාශ සැලසෙන "නිශ්චිත විෂයය ධාරාවකට අයත් නොවන" විෂයය සංයෝජන**

*** සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**

*** සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ කෘෂි විද්‍යාව**

**මෙම නිවේදනය මගින් ආවරණය නොවන යම් කරුණක් වේ නම් හෝ ගැටළු සහගත යම් කරුණක් වේ නම් ඒ පිළිබඳ ව නියෝජ්‍ය විදුහල්පති (අධ්‍යාපන සංවර්ධන) ප්‍රියාල් ද සිල්වා මහත්මා විමසිය යුතු අතර ඒ සම්බන්ධයෙන් වන අවසන් තීරණය ම විසින් ලබා දෙනු ඇත.**



**පී.එස්.පුෂ්පකුමාර**
**විදුහල්පති**
**රිච්මන්ඩ් විද්‍යාලය**
**2023.12.04**